2022 මැයි
163 කළාපය
QD 106/පුවත් 2020
පුවත්පතක් ලෙස මහ තැපැල්හලේ
ලියාපදිංචි කරන ලදී
මිල රු. 30.00
සිංහල දෙමළ බසින් පළවන එකම
සමාජවාදී පුවත්පත
එක්සත් සමාජවාදී පක්ෂයේ
ප්‍රකාශනය

# රතු තරුව
செந்தாரகை

ඇතුළත පිටු.......
- ගෝඨාගෝහෝම් ජයග්‍රහණය කරා...
- කපටි නරියා රනිල් හඳුනාගන්න
- ණය ගෙවන්න බෑ ගෙවන්නෙත් නෑ
- දකුණට ඇති උතුරට නැති සැමරුම්

# ගෝඨා ගෙදර පලයන්

ලේ රස හොඳින් දන්නා ගෝඨාභය ජනතා අරගලය මර්දනය කිරීම සඳහා හදිසි නීතිය ප්‍රකාශයට පත්කරමින් යකඩ සපත්තුව හා තුවක්කුව පෙරට දමා ඇත ආරක්ෂක ලේකම් වශයෙන් සිටියදී කටුනායක රොෂේන් චානක හා හලාවත ධීවරයකු ඝාතනය කර අනතුරුව රතුපස්වල තරුණ ජීවිත තුනක් බිලිගත් ඉතිහාසයකට ගෝඨාභය උරුමකම් කියයි. මේ වන විට ගෝඨාභය ජනාධිපති ලෙස ඔහුගේ පරණ පුරුදු සෙල්ලම පටන්ගෙන රඹුක්කන නාරම්බැද්දේදී චමින්ද ලක්ෂාන් නැමැති තරුණයා ඝාතනයෙන් වැඩ අරඹා ඇත. ඒ ගෝඨාට හුරුපුරුදු තුවක්කුවේ හා මර්දනයේ භාෂාවයි. රනිල් වික්‍රමසිංහ පැරිෂුටයකින් ගෙනෙමින් අගමැති ධුරයට පත් කළද රාජ්‍ය මර්දනයේ ස්වභාවය එලෙසම දියත් වෙමින් පවතී.

ජනමත සමීක්ෂණ කීපයකින්ම පැහැදිලිවී ඇත්තේ ජනාධිපති ධුරය අහෝසි කළ යුතු බව හා ගෝඨාභය වහාම ජනාධිපතිධුරයෙන් ඉල්ලා අස්විය යුතු බවයි. සෑම පැත්තකින්ම තම අසාර්ථකභාවය හා අපොහොසත් බව පෙන්වා ඇති ගෝඨාභය මේ රටට අත්කරදී තිබෙන විනාශය මිනිය නොහැකි තරම් එකකි. කිසිම දෙයක් ගැන දැනුමක් හෝ තේරුමක් නොමැති හිස උදුම්මවාගත් උන්මන්තකයකු බව ගොඨාභය ජනතාව ඉදිරියේ නිරුවත්වී හමාරය. 69 ලක්ෂයේ ජනවරමට මුවාවී ඔහුට තවදුරටත් බලයේ රැඳී සිටීමට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැති බව අපි අවධාරණය කර සිටිමු.

උතුර හා දකුණේ සියලු ජනතාව ජාති හා ආගම් බේද නොතකා වීදි බැස එක හඬින් කියා සිටින්නේ ගෝඨාභය ඉල්ලා අස්වී ගෙදර යායුතු බවය. අප්‍රේල් 28 දියත් කළ සංබේත වැඩ වර්ජනයෙන් හා මැයි මස 6වන දින පැවැති මහා හර්තාල් ව්‍යාපාරය ඉහලින් සාර්ථකවීම හරහා ජනතාවගේ මතය මුළු ලෝකයටම පෙන්නුම් කරන ලදී. තවදුරටත් බලහත්කාර බලයෙන් ගෝඨාභය බලයේ සිටීමට උත්සාහ දරන්නේ නම් දස ලක්ෂ ගනනින් ජනතාව පාරට බැස වීදි පුරා ගෙනයන මහ ජනතා අරගලයකින් මේ දූෂිත හොර නඩය එලවා දමන අඛණ්ඩ අරගලයක් සඳහා පියවර ගතයුතු බව රතුතරුව සපතකර සිටී.



රට ගිනි තියා නූතන හනුමන්ත 'මරා'
මහජනයාට බයේ හැංගී පැනල ගියා
වාඩුව ගන්න ජනයා මග හිඳී බලා
කළ කම් පලදෙනව 'මයින'ට නොවී පමා

ජනතා බලය මේ යයි දැන්වත් දැනගන්
මන්දිර බිමට සමතල වෙන බව හිතපන්
පවුලක් රජ කරන්නට කරපුම තරමක්
කෙරුවේ අපරාධ වැහි නැති හෙණ ගහපන්




# ජනතා අරගලය ජයග්‍රහණය කිරීම සඳහා
## ඉදිරිපත් කරන වැඩ පිළිවෙල

- ඇමරිකාවට චීනයට ඉන්දියාවට ජපානයට හා බංගලිදේශයට ගෙවීමට තිබෙන විදේශ ණය වහා අහෝසි කරනු!
- ලෝක බැංකුව හා IMF මරුඋගුලෙන් ගැලවෙමු!
- බැංකු, රක්ෂණ සමාගම්, වරාය, ගුවන්තොටුපල ඇතුලු ප්‍රධාන ආර්ථික මර්මස්ථාන ජනසතුකර ප්‍රජාතන්ත්‍රවාදීව පත්කරගත් කම්කරු කොමිටිවලට ඒවා භාරකරනු!
- සියලු අරගල මධ්‍යස්ථාන ඒකාබද්ධ කර දෙමළ හා මුස්ලිම් ජනතාව ඇතුළත් මහජන ව්‍යවස්ථාදායක සභාවක් ගොඩනගමු!
- භූමිතෙල් ගෑස් ඉන්ධන බෙහෙත් හා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පාලන මිලකට සැපයීමට වහා පියවර ගනු!
- ජනාධිපති ධුරය අහෝසි කර ගෝඨාභය ඇතුළු මුළු රාජපක්ෂ පවුලම පාලනයෙන් ඉවත් කරනු!
- ධනපති පවුල් කීපයක් හා ඔවුන්ට ගැති හමුද කොටස්වල පාලනය අහෝසි කරනු!
- ඒකාධිපතිවාදය ඥති සංග්‍රහය හා දුෂණය අවසන් කරනු!
- සංවිධානය විමට හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය තහවුරු කරනු!
- සෑම වැඩබිමක්ම ගම හා නගරය ඇතුළත් වන්නාවූ අරගල මධ්‍යස්ථාන ගොඩනගමු!
- මහජන නියෝජතයින්ගෙන් සමන්විත මහජන ව්‍යවස්ථාදයක සභාවට තෝරාපත්කර ගන්නා නියෝජිතයින් ජනවරමට පිටුපා ක්‍රියාකරන්නේ නම් ඔවුන් ආපසු කැඳවීමේ බලය ජනතාවට පවරමු!
- තෝරාපත් කරන මහජන නියෝජතයින්ට වැටුප් ගෙවීම් නතර කරනු අත්‍යවශ්‍ය නියෝජතයන්ට පුහුණු කම්කරුවකුගේ වැටුප පමණක් ගෙවනු!
- ඒකාධිපති පාලනයට එරෙහිව සටන්වදින ජනතාවට සහයෝගය දීම සඳහා ලෙස හමුදහටයින්ට ආයාචනය කරමු. තෝරා පත්කරගත් සෙබල නියෝජතයින්ගෙන් සමන්විත සටන් කමිටු හමුද බැරැක්ක තුළ ගොඩනගමු!
- මෙම අරගලය අසල්වැසි රටවල කම්කරුවන්ද එකතු කරගනිමින් දකුණු ආසියානු කම්කරු පංතියේ සහයෝගය ලබාගනිමින් මෙම කලාපයේ සමාජවාදී බලයක් සඳහා සටන් කරමු!
- ආසියානු කලාපයේ සමාජවාදී එක්සත් සමූහාණ්ඩුවක් උදෙසා සටන් වදිමු!

**ගෝලීය ධනවාදයට හා ජාතිවාදයට එරෙහි සමාජවාදී බලයක් කරා....**

රතු තරුව
செந்தாரகை
53/6 ඊ.ඩී.දාබරේ මාවත, කොළඹ 05.
E.mail – unitedsocialists@gmail.com
Tel – 4510289 / 2504647
එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න
www.lankasocialist.com

# ජන අරගලය හර්තාලය සහ පන්තියේ බලය

ගෝල්ෆේස් ජන අරගලය මේ වනවිට සති පහක්ද ඉක්මවා ක්‍රියාත්මක වෙයි. මහින්ද රාජපක්ෂගේ මැරයන් විසින් පසුගිය 9දා එයට එල්ල කරන ලද ප්‍රහාරය හේතුවෙන් එය ජන හදවත්වලට වඩාත් ආකර්ෂණීය එකක් බවට පත්වී තිබේ. එම මැරයන් හමුවේ අරගලකරුවන් දැක්වූ අධිෂ්ඨානශීලීභාවය හේතුවෙන් මෙය මේ රටේ ජනතා අරගල ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් ලෙස සටහන් වනු ඇත. නිශ්චිත සංවිධානයක් හෝ නායකත්වයක් නොමැතිව අතිශය විවිධ වූ පිරිස්වලින් සමන්විත මේ දේදුනු වර්ණ අරගලය මාස එකහමාරකට ආසන්න කාලයක් තිස්සේ අඛණ්ඩව සහ අඩුවක් නැතුව කරගෙන යෑමට හැකිවීම මේ රටේ මෑත සටන් ඉතිහාසය දෙස බලන විට හිතාගන්නටත් බැරි තරම් එකකි. අති බහුතරය තරුණයන් වන මෙම අරගලකරුවන් මේ අයුරින් පාරට බැසීම එක අතකට ලෝක මට්ටමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස ඉතිහාස ගතවනු ඇත.

මුලදී කිසිදු ස්ථාපිත මාධ්‍යයක සහයෝගයක් නොමැතිව සම්පූර්ණයෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ කරන ලද කැඳවීමක් මත ඇරඹී මේ උද්ඝෝෂණය දැන් සියලු මාධ්‍යවල සිරස්තල මවන ප්‍රධාන පුවතක් වී තිබේ. ඇත්ත වශයෙන්ම මේ වනවිට එය වැඩියෙන්ම 'මාකට්' කළහැකි පුවතක් බවටද පත්වී ඇත. 'ගෝටා ගෝ හෝම්' - ගෝඨාභය ගෙදර යනු තේමාව කරගෙන කොටුව ජනාධිපති කාර්‍යාලයේ ඉදිරි දොරටුව මුළුමනින්ම අවහිර කරමින් පැවැත්වෙන මේ උද්ඝෝෂණය දැන් ජාත්‍යන්තර වශයෙන් පවා අවධානයට ලක්වී තිබේ.

උදෑසන කාලයේදී දහසකට අඩු පිරිසක් එක්වන, රාත්‍රිය වනවිට දසදහසක් පමණ ගොනුවන මේ විරෝධතාව ඒකාකාරී හැඩයකින් යුතු එකක් නොවේ. එයට එක්වන ජනකාය විවිධ සමාජ තල - මට්ටම් නියෝජනය කරන අතර ඉහත ප්‍රධාන තේමාවට අමතරව විවිධ ඉල්ලීම් ද ඉදිරිපත් කෙරෙනු දැකිය හැකිය. ඒ සියල්ලම පාහේ රජයට විරෝධය පළ කරමින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ ප්‍රතිසංස්කරණ ඉල්ලා කෙරෙන විරෝධතා වේ. 225ම ගෙදර යන්න කියන සටන්පාඨය ඒ අතරින් ප්‍රධාන වේ. එමෙන්ම දේශපාලකයන් සහ ඉහළ නිලධාරීන් විගණනයට යටත් කිරීම, රාජපක්ෂ කල්ලිය සහ ඔවුන්ගේ සහචරයන් විසින් කොල්ල කා ඇති රටේ මුදල් ආපසු රටට ලබාගැනීම වැනි ඉල්ලීම් ප්‍රධාන වේ. අගමැති ධුරයෙන් ඉල්ලා අස්වී සිටින මහින්ද රාජපක්ෂ මැර ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම යන ඉල්ලීමද මේ වනවිට ඔවුන්ගේ ඉල්ලීම් ගොන්නට එකතු වී තිබේ.

මේ අරගලයේ ප්‍රධානතම ස්වරූපයක් වී ඇත්තේ රටේ විවිධ ප්‍රදේශවලින් සහ පාර්ශ්වවලින් එයට ලැබෙන සහයෝගයයි. ඒ අනුව එය මුළු රටම නියෝජනය කරන අරගලයක් බවට පත්වී ඇත. තවමත් උතුරු නැගෙනහිර ජනයා මේ අරගලයට ඍජු ලෙස බද්ධ වී නැති වුවද ගෝඨාභය ජනාධිපතිවරයා එලවීම මුල්කොටගත් සටනකට ඔවුන්ගේ සහාය අහිමි වන්නේ නැත. ඒ අතර කොළඹ සහ වෙනත් පළාත්වල වෙසෙන මුස්ලිම් ජනයා මේ අරගලයට ඍජු ලෙස සම්බන්ධ වී සිටීම සතුටට කරුණක් වන අතර සිංහල සහ මුස්ලිම් තරුණ පරපුර අතර සමීප සම්බන්ධයක් ගොඩනැගීමට එය හේතුවී ඇත. කෙසේවෙතත් මුස්ලිම් ජනයාට එල්ල වී ඇති ජාතික පීඩනය දුරු කිරීමට නම් තව බොහෝ දුර යායුතු අතර මේ අරගලය තුළින් ඒ සඳහා ප්‍රවේශයක් ගැනීමට හැකියාවක් ඇත.

අරගලයේ නිරතවූවන් පවසන්නේ ගෝඨාභය ජනාධිපතිවරයා ඉවත්වන තුරු සටන ගෙනයන බවයි. එහෙත් තවමත් ඔහු ඉවත්වන පාටක් පේන්නට නැත. "නිර්පාක්ෂික සාමකාමී අරගලය" ඇරඹී අප්‍රේල් 9දා සිට එය පොදු ජනයාගේ ආදරය ලබන ආකර්ෂණීය සටනක් වුවද එයින් රජයට හෝ පාලක කල්ලියට එතරම් බලපෑමක් තිබූ බවක් පෙනෙන්නට නොතිබිණි. අරගලය ගාලුමුවදොර පවතින අතර රාජ්‍යයේ පැවැත්ම බාධාවකින් තොරව ක්‍රියාත්මක විය. ජනාධිපතිවරයා ජනාධිපති කාර්‍යාලය වෙනුවට ඒ ආසන්නයේ පිහිටි ජනාධිපති මන්දිරයේ සිට ඇමති මණ්ඩලය පත්කිරීම ඇතුළුව සියලු රාජ්‍ය පාලන කටයුතු කරගෙන ගියේය.

රාජ්‍යයේ ක්‍රියාකාරිත්වයට ඍජු බලපෑමක් එල්ල කෙරුනු පළමු අවස්ථාව වූයේ අප්‍රේල් 28දා ක්‍රියාත්මක කරන ලද වැඩවර්ජනයයි. රාජ්‍ය අංශයේ කටයුතු මුළුමනින්ම පාහේද පෞද්ගලික අංශයේ සෑහෙන මට්ටමකින්ද අකර්මණ්‍ය කෙරුනු මේ වැඩවර්ජනය නොතකා හරින බවක් පෙන්නුම් කිරීමට රාජපක්ෂ පාලනය උත්සාහ කළද එය ඔවුන්ට ඇඟට දැනුන බව ඔවුන්ගේ කියුම් කෙරුම්වලින් පැහැදිලි විය.

ආණ්ඩුව ජනමතයට සවන් නොදෙන බව පෙනීගිය තත්වයක් තුළය පසුගිය 6දා හර්තාල් ව්‍යාපාරයක් දියත් කරන ලද්දේ. හර්තාලය යන ඉන්දීය වචනය සිංහල වචන කෝෂයට එකතු වූයේ 1953 මහා හර්තාලය සමග ය. එයින් වසර 69කට පසු මෙවර හර්තාලය දියත් කරන ලද්දේ සියලු වෘත්තීය සමිති ඒකාබද්ධ වීමෙනි. පසුගිය කාලාන්තරයක් තිස්සේ නිද්‍රාශීලි ලෙස කටයුතු කිරීම හේතුවෙන් මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරය වැහැරී දුර්වල වී තිබූ තත්වයක් තුළ වෘත්තීය සමිති කළ මෙම කැඳවීමට වැඩකරන ජනයා වෙතින් මෙතරම් ඉහළ ප්‍රතිචාරයක් ලැබුණේ රාජපක්ෂ පාලනය කෙරෙහි ඔවුන් තුළ තිබූ දැඩි විරෝධය නිසාමය.

සතියක් ඇතුළත ක්‍රියාත්මක කරන ලද දෙවැනි වැඩවර්ජනයද සාර්ථක වූවා පමණක් නොව වෙළෙඳ සංගම්, පෞද්ගලික බස් හිමියන් සහ කාර්ය මණ්ඩල, සහ සමාජයේ විවිධ තරාතිරම්වල කොටස් වෙතින් හර්තාලයට පූර්ණ ලෙස සහයෝගය ලැබිණි. නිදහස් වෙළෙඳ කලාපවල සේවකයෝ පවා වැඩවර්ජනය කළහ. රටම අකර්මණ්‍ය වූවා පමණක් නොව ජනශූන්‍ය කලාපයක් බවටද පත්විය. ආණ්ඩුවට කරකියා ගත නොහැකි තත්වයකි උද්ගත වී තිබුණේ.


අප්‍රේල් 28දා වැඩවර්ජනය මෙන්ම මැයි 6දා හර්තාලය සම්බන්ධයෙන්ද ආණ්ඩුවට තිබුණු එකම අස්වැසිල්ල වූයේ එම ක්‍රියාමාර්ග දෙකම එක දිනකට පමණක් සීමාකර තිබීමය. මේ ක්‍රියාමාර්ග දෙකම ආණ්ඩුවට කරන ලද අනතුරු ඇඟවීම් විය. ජනාධිපතිවරයා සුපුරුදු පරිදි එක අතකට උද්ධච්ච සහ අනෙක් අතට නෑසුනු පිලිවෙතක් අනුගමනය කරන්නේ නම් ඔහුට ඇස් ඇර කණ් යොමා බලන්නට ඇසෙන්නට සිදුවන ක්‍රියාමාර්ගයක් ගැනීමට වෘත්තීය සමිති සූදානම්ව සිටී. ඉදිරි දිනකදී සියලු වෘත්තීය සමිති ඒකාබද්ධ වී අඛණ්ඩ වැඩවර්ජනයක් දියත් කිරීමේ තත්වයක් දැන් නිර්මාණය වී තිබේ.

කෙසේවෙතත් මේ සමස්ත ක්‍රියාදමය තුළින් ඕනෑම ජන සටනක් අරගලයක් සඳහා උකහාගත යුතු වැදගත් පාඩමක් අපට කියාදෙයි. තරුණයන් හුදෙක් වීදි බැස කරන සටනක් කොතරම් කල් ගතවුවද එයින් පාලක පන්තියට කළහැකි බලපෑම අල්පය. කම්කරු පන්තියේ දින දෙකක අරගලය විසින් ආණ්ඩුව බිත්තියටම හේත්තු කරන ලදී. පවතින තත්වය අනුව දෙක තුනක වර්ජනයක් තුළින් වුව ආණ්ඩුව දණගැස්විය හැකි මට්ටමක් ඇත. රටම අකර්මණ්‍ය කරන රාජ්‍ය පාලකයන් නාමමාත්‍රික තත්වයකට පත්කරන බලයක් සහ හැකියාවක් ඇත්තේ වැඩකරන ජනතාවට බව මෙයින් මොනවට පැහැදිලි නොවන්නේද?

ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ ආණ්ඩුව කෙරෙහි පවත්නා දැවැන්ත විරෝධය සහ පිළිකුල් සහගත තත්වය තුළ කම්කරු පන්තිය සැනෙකින් වැඩවර්ජනය කිරීමට එක්වුවද එය හැමදාම හැමවිටම එලෙසම කිරීමට හැකිවෙතැයි සිතිය නොහැකිය. නායකයන් අණකරන විට නොඑසේනම් දැන් වර්ජනයක් කරමුයයි කී පමණින් කම්කරුවන් වර්ජනය කරන්නේ නැත. ඒ සඳහා කම්කරුවන්ට නායකත්වය ගැන විස්වාසයක් තිබිය යුතුය. ඒ විස්වාසය ගොඩනැගිය හැකි වනුයේ නායකත්වය කොතෙක් දුරට සාමාජිකත්වය වෙත වග වන්නේද (accountable) යන්න මත ය. ඒ සඳහා වෘත්තීය සමිති ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත ගොඩනැගිය යුතු අතර සමිතියේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය විවෘත සහ පාරදෘශ්‍ය එකක් විය යුතුය.

ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති සම්ප්‍රදායක් සහ ඒ අනුව ගොඩනැගුනු ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් මධ්‍යස්ථානයක් මගින් කම්කරු පන්තියේ බලය මොනවට පෙන්නුම් කළහැකි වනු ඇත. ධනපති පාලක පන්තියේ මිනීවල හෑරීමේ ශක්තිය සහ හැකියාව ඇත්තේ වැඩකරන ජනයා අත බව නැවත අවධාරණය කිරීමට මේ හොඳම කාලයයි.

# කපටි නරියා රනිල් හඳුනාගන්න



පහුගිය මැයි 12 හැන්දෑවෙ වුනේ මුළු තුන්ලෝකෙම සිදුවෙන සිද්ධියක් නෙවෙයි. ඒ තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ඇරැයුමින් රනිල් වික්‍රමසිංහ රටේ අගමැතිවරයා වීම. මහ බැංකු මංකොල්ලයේ මහ මොළකරු, රට විදේශිකයන්ට පාවාදෙන්නා ආදී වශයෙන් පොහොට්ටුවේ මැතිවරණ වේදිකාවලදී ගෝඨාභය ඇතුලු රාජපක්ෂ නඩය පට්ට ගහන ලද රනිල් පොහොට්ටු ආණ්ඩුවේ අගමැති ධුරයට පත්වී තිබේ. එක අතකට පාලක පොදුජන පෙරමුණ කොයි තරම් අසරණ වී තියෙනවද කියන එක වගේම රනිල් වික්‍රමසිංහ මොනතරම් කපටියෙක්ද කියන එකත් මෙයින් පෙන්නුම් කෙරෙනවා.

LTTE සංවිධානයේ න්‍යායාචාර්‍යවරයා වූ ඇන්ටන් බාලසිංහම් 2003 විතර කාලයේදීම රනිල්ව හොඳට අඳුනගත්ත. ඒ නිසා තමයි ඔහු කිව්වෙ රනිල් වික්‍රමසිංහ කියන්නෙ කපටි නරියෙක් කියල. ඒ බව රනිල් අගමැති ධුරය භාරගැනීමෙන් තමන්ම ඔප්පු කරල පෙන්නුව. මේ තනතුරට පත්වීමට හෝ භාරගැනීමට ව්‍යවස්ථානුකූල මෙන්ම සදාචාරාත්මක වශයෙනුත් අයිතියක් නැති ඔහු කිසි ලැජ්ජාවක් බයක් නැතුව අගමැති ධුරය භාරගත්ත හැටි ඇත්ත වශයෙන්ම හිරිකිතයි.

රනිල් කියන්නෙ පහුගිය මහ මැතිවරණයේදී මහජනයා විසින් තීරණාත්මක ලෙස පරාජය කරන ලද පුද්ගලයෙක්. ඔහුට අගමැති ධුරය තියා මන්ත්‍රී ධුරයවත් දරන්න බැහැ ජාතික ලැයිස්තුව නොතිබෙන්නට. කිසිම ආකාරයක ජනවරමක් ඔහුට නැහැ. හතර වටින්ම පහර කමින් අසරණව හිටිය ගෝඨාභය ජනාධිපතිවරයා පිදුරු ගහේ එල්ලෙනව වගේ රනිල්ගෙ ඇඟේ එල්ලුන එක තේරුම් ගන්න පුළුවන්. ඒත් සුද්දන්ගෙ සදාචාරය සහ මැනර්ස් (manners) දන්න රනිල් වික්‍රමසිංහ අගමැති ධුරය භාරගැනීම ඔහු මොනතරම් කපටියෙක්ද සහ මහින්ද රාජපක්ෂ මෙන්ම බල තන්හාවෙන් පිරුනු මිනිහෙක්ද කියල කියාපානව.

ඒක වඩාත් පෙන්නුම් කෙරෙන්නෙ අගමැති හැටියට දිවුරුම් දීල පන්සල් ගිහිල්ල කිව්ව බොරුවෙන්. එංගලන්තයේ වින්ස්ටන් චර්චිල් අගමැති ධුරයට පත්කෙරෙන විට ඔහුට හිටියෙ මන්ත්‍රීවරුන් හතර දෙනයි. ඒක නිසා මට මේක මහදෙයක් නෙවෙයි කියල තමයි ඔහු කිව්වෙ. මේ උදාහරණය මුළුමනින්ම වැරදියි. චර්චිල් අගමැති ධුරයට පත්කෙරෙන විට ඔහුගේ කොන්සර්වටිව් පක්ෂය තමයි බලයේ හිටියෙ. චර්චිල් ඒ වනවිට මහජන ඡන්දයෙන් තේරී පත්වූ මන්ත්‍රීවරයෙක්. දෙවැනි ලෝක යුද්ධය පටන් ගන්න කාලයේ අගමැති ධුරයෙහි සිටි නෙවිල් චැම්බර්ලේන්ගෙ නායකත්වය දුර්වලය කියල විවේචන එල්ල වෙන විට ඔහු ඉල්ලා අස්වුනා. ඊට පස්සෙ තමයි චර්චිල් අගමැති ධුරයට පත්කෙරුනේ. චර්චිල් රනිල් වගේ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරල පාරාජිකා වෙච්ච කෙනෙක් වුනේ නැහැ.


රනිල් බොහෝ බලතල සහිතව අගමැති ධුරය දැරූ 2015-2019 කාලය අපට හොඳට මතකයි. ඒ කාලයේ ඔහු ජනමතයට කිසිදු අයුරකින් කන් නොදී හම්බන්තොට වරාය විකිණූ හැටි අපට අමතක නැහැ. මත්තල ගුවන් තොටුපොළ විකුණගන්න හැදුවට බැරිවුනා. GSP+ බදු සහනය හැර බටහිර රටවලින් ඔහුට එදා කිසිදු විශේෂ ආධාරයක් ලැබුණේ නැහැ. MCC ගිවිසුම හරහා ඇමරිකාවේ භූ දේශපාලනික උවමනාවන්ට මෙරට පාවාඩයක් කරල දෙන්නයි එදා සැලසුම් කෙරුවෙ. මෙච්චර ආර්ථික අර්බුදයක් නොතිබුණු එදාත් ඔහු ජනතාවට කිව්වෙ තිත්ත බෙහෙත් බොන්න ලෑස්ති වෙන්න කියල.

රනිල්ගේ දේශපාලන ජීවිතයේ කළ ලොකුම පාදඩකම තමයි මේ විදියට අගමැතිකම භාරගැනීම. ඒ ඇර වැඩිය ප්‍රසිද්ධ නැති පාදඩකම් දෙකක් පෙන්නල දෙන්න පුළුවන්. දෙකම ශ්‍රී ලංකන් එයාර්ලයින් එක හා සම්බන්ධයි. ඔහු 2015 අගමැති ධුරයට පත්වූ ඉක්මනින්ම කමිටුවක් පත්කළා ගුවන් සේවයේ සිදුවී ඇති දූෂණ වංචා ගැන හොයන්න. එම වැලිඅමුණ කමිටුව රාජපක්ෂ පාලන සමයේ එහි සිදුවී ඇති දූෂණ වංචා පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබාදුන්නා. ඒ පිළිබඳව ඒ වෙලාවෙ මාධ්‍යවල ලොකුවට කතා කෙරුවට ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගත්තෙ නැහැ.

අනෙක් කාරණය තමයි ශ්‍රී ලංකන්හි ප්‍රධාන විධායක පත්කිරීම. ඒ සඳහා පත්කරන ලද්දේ සුරේන් රත්වත්තෙ කියන පුද්ගලයා. ඔහු රනිල්ගෙ දකුණු අත වගේ ඉන්න චරිත රත්වත්තෙගෙ සහෝදරයා. ඔහුට මිලියන 3ක මාසික වැටුපක් ගෙව්ව. ඒත් ශ්‍රී ලංකන් එකට මොකද වුනේ? එන්න එන්නම පාඩු වැඩිවෙලා රටට මහා බරක් වෙලයි තියෙන්නෙ. ඇමති මණ්ඩලයක්, පාර්ලිමේන්තු කණ්ඩායමක් තිබුණට රනිල් වැඩකළේ තමන්ගෙම යාලුවො කල්ලියක් එක්ක. රටේ අනාගතය තීරණය කළේ මේ කල්ලිය විසිනුයි.

ඒ නිසා රට ස්ථාවර කරගන්න රනිල්ට සහාය දෙන්න වගේ කතාවලට අප නම් කිසි ආකාරයකින් සම්මාදම් වෙන්නෙ නැහැ. රට පුරා දින මාස ගණන් දිවා රෑ නොතකා අරගලයෙ නිරත වී සිටින තරුණයන් හිතන්නෙත් මේ අයුරින්මයි. කැහි ගෑනි වෙනුවට හොටු ගෑනිව ගෙනැවිත් අපට බාරදෙන මේ ධනපති සිස්ටම් එක උඩු යටිකුරු කර වෙනස් කරන්න අප ගෙනයන අරගලය දිගටම ගෙනයනව.

ලක්දිනු






# Go Home Gota ජයග්‍රහණයක් කරා...

පසුගිය මාර්තු 31 වෙනි දින රාත්‍රියේ ගෝඨාභයගේ මිරිහාන නිවස අසලින් ආරම්භවූ ජනතා විරෝධය මේ වන විට මාස 1 1/2ක් දක්වා දියත් වෙමින් පවති. ආරම්භයේදී ප්‍රධාන වශයෙන් තරුණ ක්‍රියාකාරීත්වයට සීමාවී විවිධාකාර විවේචන හා සීමාවන් මධ්‍යයේ ආරම්භවූ මෙම ක්‍රියාකාරීත්වය මේ වන විට ජන අරගලයක් බවට පරිවර්තනය වෙමින් ඇත. පාර්ලිමේන්තුවේ 2/3 අසීමිත ජයග්‍රහණයක් සමගින් මහා පර්වතයක් ලෙස විදහා දක්වමින් බලයට පත්වූ පොදුජන පෙරමුණු ආණ්ඩුව මෙම ජනතා ක්‍රියාකාරීත්වය නිසා බරපතල අර්බුදයකට මුහුණ දෙමින් කැබිලි බවට පත්ව සිටින බව වසන් කළ නොහැකිය. රාජපක්ෂ පාලනය කෙරෙහි ස්තෝත්‍ර ගයමින් ඒ හරහා අතිවිශාල ලාභය ගරා ගනිමින් පවත්වාගෙන ගිය ඊනියා ස්වාධීන ජඩ මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්තිකරණය වේගයෙන් වෙනස්වීම පෙන්වන්නේ ජනතාව ඉදිරියේ ඔවුන් ඇඳිවත තමන් විසින්ම ගලවා දැමීමක් වැනිය. ජනාධිපති හා අගමැති අතර ගතයුතු දේශපාලන ක්‍රියාමාර්ගය ගැන තියුණු මතබේදය අවසන්වුයේ මැයි9 වන දින අරලියගහ මන්දිරයෙන් ආරම්භ කළ මයිනාගේ මැරයින්ගේ ප්‍රචන්ඩත්වය අභිබවා රටපුරා මතුවූ මහා ජනතා අරගලයේ බලපෑම නිසා මයිනාට අගමැතිධුරය අත්හැරීමට සිදුවීම සමගින්ය.

ජන අරගලයේ බලපෑම නිසා පලමුවටයේදීම ගෝඨාභයගේ ඇමති මණ්ඩලයට ඉල්ලා අස්වීමට සිදුවිය. මහ බැංකුවේ අධිපති ලෙස කටයුතු කළ කුප්‍රකට දූෂිතයෙකු වන අජිත් නිවාඩ් කබ්රාල්ට ගෙදරයෑමට සිදුවිය. ඇමති මණ්ඩලයේ කටයුතු කළ බොහොමයක් ඇමතිවරු නැවත ඇමතිධුර භාරගැනීම ප්‍රතික්ෂේප කලේය. අලුතින් පත්වූ ඇමති මණ්ඩලය ජනතාව දකින්නේ හුදෙක් පඹයින් පිරිසක් රට පාලනය කරන සෙයකි. මුදල් ඇමතිධුරය භාර ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවූ අතර අවසානයේදී ගෝඨාභයගේ පුද්ගලික මිත්‍රයෙකු වන අලිසබ්‍රිට එය පැවරු අතර ඔහු දින කීපයක් යෑමට මත්තෙන් ඉල්ලා අස්විය. ගෝඨාභයගේ පෙරැත්ත නිසා නැවත මුදල් ඇමති බවට සබ්‍රි පත්විය. එසේ නමුත් මැයි 9 වන දින පුපුරා ගිය දැවැන්ත ජනතා විරෝධය ඉදිරියේ මහින්ද මයිනා ඇතුලු ඇමති මණ්ඩලයම තොලොන්චිවී ගියේය.

මහින්ද රාජපක්ෂ සිය කැමැත්තෙන් අගමැති ධුරයෙන් ඉවත්වුයේ නැත. මැයි 9 වෙනි දින ලංකාව පුරා ඇවිලිගිය ජනතා නැගිටීම විසින් මහින්දට ඉල්ලා අස්වීමට බලකෙරින. මැයි 9 වෙනි දින ඇතිවූ ජනතා පිබිදීම අප රටේ ඉතිහාසයට අලුත් අත්දැකීමක් එකතු කරන්නක් වියග එම ජනතා නැගිටිම විප්ලවවාදී නායකත්වයකින් තොරව ඇතිවූ 'විප්ලවකාරී' නැගිටිමක් ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ. මැයි 9 සිදුවූ ජනතා නැගිටීම පෙන්නුම් කළේ මාස ගනනාවක් පුරා ජනතාව පීඩනයට පත් කරමින් රාජපක්ෂ පවුල් නඩය ගෙනගිය දූෂිත පාලනයට එරෙහිව ජනතාව තුළ මෝරමින් කැකෑරෙමින් පැවැති වෛරය හා ක්‍රෝධය පුපුරා එලියට ඒමය. පැය කීපයක් ඇතුලත සංවිධානාත්මක මෙහෙයවීමකින් තොරව ජනතාව වෙතින් ප්‍රකාශයට පත්වූ ධනපති ආණ්ඩු විරෝධය මුලු රටම දෙදෙරා යැවීමට සමත්විය. සැබැවින්ම එදා සිට දින ගණනාවක් තිස්සේ මෙරට ආණ්ඩු පාලනයක් නොතිබු අතර රට තුළ ද්වන්ධබල තත්වයක් (එක හා සමාන බල තන්ත්‍ර දෙකක්) නිර්මාණය විය. 1953 හර්තාලයෙන් පසුව මෙවන් තත්වයක් රටතුළ ඇතිවුයේ මෙම ජනතා නැගිටීම හරහාය.

විෂය බද්ධ තත්වයේ ඇතිවූ මෙම ගුණාත්මක වර්ධනයට නායකත්වයක් දියහැකි ශක්තිමත් විප්ලවවාදී පක්ෂයක් තිබුනේ නම් මෙම ජනතා නැගිටීම විප්ලවකාරී පරිවර්තනයක් සඟා අවශ්‍ය වන ඊළඟ පියවර කරා මෙහෙයවීමට හැකියාව තිබුණි. එම ගුණාත්මක වෙනස ඇති කිරිමට අපොහොසත්වීම හේතුකොට ගෙන ඊනියා අන්තර්වාර පාලන උගුලක් ඇටවීමට ධනපති පංතියට ඉඩ විවෘත විය. රනිල් වික්‍රමසිංහ වැනි පාරාජිකාවූ ධනපති නායකයෙකුට තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩ සැලසීම ජනතා අරගලයේ පරමාර්තය නොවුන බව ඉතා පැහැදිලිය.

## 69 ලක්ෂයේ ජනවරම

ගෝඨාභය තවදුරටත් බලයේ එල්ලී සිටීම සඳහා පාවිච්චි කරන එකම මන්තරය 69 ලක්ෂයේ ජනවරමක් ඔවුන්ට ලැබී තිබෙන බව නැවත නැවතත් පුනරුච්චාරණය කිරිමය. 2019 නොවැම්බර් වල ඔවුන් ලබාගත් 69 ලක්ෂයේ ජනවරම ඔවුන්ට තවමත් තිබෙන බවට පෙන්විය හැකි සාක්ෂිය කුමක්ද සැබැවින්ම ඔවුන් එදා ලබාගත් 69 ලක්ෂයෙන් කාලක්වත් අද රාජපක්ෂවරුන්ට ලබාගත නොහැකිය. සියලු ස්වාධීන ජනමත සමීක්ෂණ වලින් පෙන්නුම් කර තිබෙන්නේ ජනගහනයෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් ගෝඨාභය ගෙදරයා යුතුය යන අදහස නියෝජනය කරන බවය. බලයේ සිටින දේශපාලකයින් ජනමතයට ඉඩදී හිසනමා බලයෙන් ඉවත්ව ගිය බවට ලෝකය පුරා උදාහරණ ඕනෑවටත් වඩා තිබේ.

මේ සදහා ලංකා ඉතිහාසයේ තිබෙන හොඳම උදාහරණය 1953 අගෝස්තු මහා හර්තාලයයි. එක් දිනකට සීමාකරමින් සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ ඒකාබද්ධව දියත් කළ මහා වැඩ වර්ජනය හා හර්තාලය නිසා එවකට බලයේ සිටි ඩඩ්ලි සේනානායකගේ ආණ්ඩුව අර්බුදයකට ඇද දැමීය. හර්තාලයෙන් පෙන්වූ ජනතා මතයට හිස නමා ඩඩ්ලි සේනානායක වහාම අගමැතිධුරයෙන් ඉවත්විය. ඩඩ්ලි එම අවස්ථාවේදී 1952 මැතිවරණයෙන් ඔහුට ලැබුණ ජනවරම ගැන කියමින් ජනමතය යටපත් කිරීමට උත්සාහ දැරුවේ නැත. ගෝඨාභය ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගැනීමට අසමත් වන්නේ නම් නුදුරේදීම ඔවුන්ම සිහසුනෙන් පලවා හැරීමට අවධිවී සිටින ජන අරගලය සමත්වන දිනය වැඩි ඈතක් නොවනු ඇත.

රාජපක්ෂ පාලනය මේ රටට කර තිබෙන විනාශය සුළුපටු නොවේ. චිරාත් කාලයක් ජනාධිපති පුටුවේ වැජඹීමේ සිහිනයෙන් පසුවූ මහින්ද රාජපක්ෂ 2010 වසරේදී 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ හදිසි පනතක් වශයෙනිග පැය 24ක් තුළ එහි අනුකූලභාවය ගැන ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසීමක් ලබාගෙන මහජන සංවාදය පවා අහුරා එම පනත ඔහු විසින් සම්මත කර ගනු ලැබීයග මහින්ද රාජපක්ෂ මේ අන්දමට තම පුද්ගලික අභිලාෂයන් ඉටුකර ගැනීම සඳහා පාවිච්චි කරනු ලැබුවේද 2009 යුද්ධ ජයග්‍රහණයෙන් පසුව 2010 ජනාධිපතිවරණයෙන් ලබාගත් ඊනියා ජනවරමය. 2019දී ගෝඨාභය ජනාධිපතිධුරයට පත්වීමෙන් අනතුරුව ඊට පෙර සම්මතකර තිබූ 17 හා 19 ව්‍යවස්ථා සංශෝධන දෙකම අහෝසි කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී. 19න් ජනාධිපති ලෙස තමාගේ අතපය බැඳදමා ඇති බව ගෝඨා නිතර ප්‍රකාශ කළ අතර ඊට විසඳුම වශයෙන් 19 අහෝසි කර 20 ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය බව කියා සිටියේය. ඒ අනුව පොදු ජන පෙරමුණේ සිටින විමල් වීරවංශ, උදය ගම්මන්පිල, වාසුදේව නානායක්කාර, තිස්ස විතාරන කොමියුනිස්ට් පක්ෂයේ වීරසුමන යන මන්ත්‍රීවරුන්ගේ ඡන්දය සමග අති භයානක බලතල සහිත 20 වන සංශෝධනය 2020 ඔක්තෝම්බර් 29 වන දින සම්මත කර ගන්නා ලදී. එදා සිට මේ දක්වා අධිබල සහිත විධායක ජනාධිපතිධුරය හොබවන ගෝඨාභය මේ රටට අත්කර දී තිබෙන විනාශය සුළු පටු නොවේ. ගෝඨා හා මහින්ද යන මොවුන් දෙදෙනාගේම දේශපාලන දිවිය අවසන්කර ඔවුන්ට සුසානභූමියේ තැන්පත් කළ යුතු වන්නේ ඒ නිසාය.

ලංකාව වැනි කුඩා රටකට විධායක ජනාධිපති ක්‍රමය වැනි ඒකාධිපති පාලන ව්‍යුහයකින් සිදු කර තිබෙන විනාශය නැවත ආපසු හැරවිය නොහැකි තරම් බරපතලය. අධිකරණය විසින් මිනිමරුවන් බවට තීන්දු කරන ලද මිනීමරුවන්ට ජනාධිපති සමාව දීම සාධාරණය කළ හැක්කේ අමනයින්ට පමණී. මහා පරිමාන දූෂිතයින්ට නිතිපති දෙපාරතමේන්තුව විසින් පවරා තිබෙන නඩුවලින් නිදෙස් කොට නිදහස් කිරිම කෙතරම් අශිලාචාර ක්‍රියාවක්ද? බුද්ධාගම රාජ්‍ය පාලනයට සෘජුලෙස සම්බන්දකර ගනිමින් මේ රටට මේ නඩය ඇතිකර තිබෙන විනාශකාරී තත්වය එලෙසම බරපතලය. මුස්ලිම් ජනතාවට එරෙහිව ඥණසාර වැනි බෞද්ධ භික්ෂූන් යොදා ගනිමින් අලුත්ගම දර්ගා නගරයේදී ද අම්පාර හා දිගන යන ප්‍රදේශවලද සිදු කළ මහා විනාශය රාජපක්ෂවරුන් බලයට පත්වීම සඳහා ඔවුන් විසින් කරන ලද තුච්ච ජාතිවාදී හා ආගම්වාදි මැදිහත්විමක් බව මේ වන විට Go Home Gota ගම වෙනුවෙන් ගෝල්ෆේස් පිටියට එක්ව සිටින ජනතාව තේරුම් ගනිමින් සිටීම අප ලද ජයග්‍රහණයක්ය.

## සමාජීය හා දේශපාලන අර්බුදය

කම්කරු පංතිය ගොවි ජනතාව හා පහල මධ්‍යම පංතිය ඇතුලු දුගී ජනතාව ඉතිහාසයේ පෙර නොතිබුනු තරම් ආර්ථික අර්බුදයකට ඇඳවැටී ඇත. මෙකී අර්බුදය ධනපති නව ලිබරල්වාදී ආර්ථික වැඩ පිළිවෙල හේතුකොට ගෙන උද්ගතවූ බව යටපත් කළ නෙහැකිය. ගෝඨා හා මහින්ද ගෙදර යැවීම යන සටන් පාඨ වලින් ප්‍රායෝගික තලයේ ගම්‍ය වනුයේ එයයි. ගෝඨා හා මහින්ද ඇතුලු පොදුජන පෙරමුණේ ආණ්ඩුව ගෙදර යැවීම අත්‍යවශ්‍ය වුවද ඒ තුළින් පමණක් රට මුහුණ දෙන සමාජ ආර්ථික අර්බුදයට විසඳුම් නොලැබෙනු ඇත. රටේ ජනතාව මුහුණදෙන විනාශයන්ට සාර්ථක පිළිතුරු සපයා ගැනීමට අවශ්‍ය නම් ක්‍රමයේ වෙනසක් ඇති කළ යුතුය. එම ක්‍රම වෙනස වෙන කිසිවක් නොව සමාජවාදී පරිවර්තනයක් විය යුතුය. මෙම කටුක හා දීර්ඝකාලීන විසඳුම් කරා ජනතාව යොමු කර ගැනීම අසීරු කරුණක් වුවද එය සාර්ථක කරගැනීම අනිවාර්යයෙන්ම ඉටුකළ යුතු කාර්යයකි.

මහින්ද අගමැතිධුරයෙන් ඉවත්වීම අර්බුදයට විසඳුම වශයෙන් වීදිබැස සිටින ජනතාව පිළිගන්නේ නැත. එවැන්නක් පිළිගන්නේ දේශපාලන වශයෙන් පාරාජිකාවී සිටින වීරවංශ ගම්මන්පිල වාසුදේව හා මෛත්‍රීපාල වැනි දේශපාලන අමනයින් පමණය. එබැවින් ගෝඨා ඉවත්වීම කිසිලෙසකින්වත් යටගැසිය නොහැකි අත්‍යවශ්‍ය කරුනක් බවට පත්වී හමාරය. ගෝඨා ජනාධිපතිධුරයෙන් පහකර ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම අත්‍යවශ්‍ය කරුනක් බවට පත්ව ඇත.

මෙම අර්බුදයට විසඳුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සීමාවී සොයා ගැනීමට දරණ උත්සාහය නිෂ්පල දෙයකි ඉහතින් සඳහන් කළ අන්දමට ගෝඨාභය ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස්නොවන්නේ නම් පැනැනගී තිබෙන ජන විරෝධතාවය ඉදිරියේ තිබෙන විකල්පය කුමක්ද යන්න වැදගත් ප්‍රශ්නයකි. ගෝඨා හා රාජපක්ෂ පවුල් නඩය දේශපාලන භූමියෙන් ඉවතට ඇද දැමීමේ ජනතා අරගලය ශක්තිමත්ව නොනවත්වාම ඉදිරියට පවත්වා ගෙනයාම අවශ්‍ය වන්නේ ඒනිසාය. මෙම අපේක්ෂාව ජයග්‍රහණයකින් අවසන් කිරිම සදහා දැනට ක්‍රියාත්මක වැඩ වර්ජනයක් මැදිකර ගත් හර්තාල් ව්‍යාපාරය තව තවත් ශක්තිමත් කළ යුතුය. එපමණක් නොව ගෝටාභය ඇතුලු රාජපක්ෂ නඩය බලයෙන් පහකිරීම සදහා 1986දී පිලිපීන ජනතාව ෆර්ඩිනැන්ඩ් මාකෝස් නැමැති ඒකාධිපතියා පලවාහැරීම සදහා ඔහුගේ මාලිගය වටකර ඉන් වර්ධනය වූ ලක්ෂ සංඛ්‍යාත ජනතා නැගිටීම ආදර්ශයට ගැනීම ලංකාවේ ඊළඟ පියවර වියයුතුය. ලක්ෂ ගනන් ජනතාව මුළු කොළඹ නගරයම අල්ලාගෙන ගෝඨා ගෙදර යනතුරු ජන අරගලය ව්‍යාප්ත කිරිමට සියලු ජනතාව සූදානම් විය යුතුය.

ගෙවී ගිය වසර 50ක පමණ කාලය තුල රට පාලනය කළ සියලු සිංහල ධනපති නායකයින්ගේ කැරුට්ටුව වන්නේ නැගී එන ජනතා අරගලයන් ලෙයින් නහවා මර්දනය කිරිමය. 1970 වසරේ සිට බලයේ සිටී සිංහල ධනපති නායකයින් සිදුකළේ ජනතා බලවේගවලට එරෙහිව මර්ධනකාරී හස්තය ඉදිරියට දැම්මය. ගෝඨාභය විසින් පසුගිය මැයි මස 6 වන දින පැවැති සාර්ථක හර්තාලය අවසන්වීම සමග හදිසිනීතිය ප්‍රකාශයට පත්කලේ මර්දනයෙන් ජනතා නැගිටීම විනාශකර දැමීමේ චේතනාවෙනි. ගෝඨාභය හමුදා මැදිහත්වීමකින් ජන අරගලය යටකර දැමීම සඳහා පියවර ගන්නේ නම් එය අවසාන විය හැක්කේ රට ලේ විලක් බවට පත්කිරීමෙන් පමණි. ජනතා විරෝධය නොතකා බලයේ සිටීමට කැසකවන ගෝඨාභයගේ අන්තිම තුරුම්පුව හමුදා පාලනයක් ඇටවීමට උත්සාහ කිරීමය. එවැනි පියවරකට ඔහු ගමන් ගන්නේ නම් එය ගෝඨාගේ අවසානයද විය හැකි බව අවධාරනය කළ යුතුය.

අඛන්ඩව ඉදිරියට ඇදී යන ජනතා අරගලය පෙන්නුම් කරන්නේ වසර 74ක් පුරා ඇදී ආ බෙලහීන හා දුර්වල ලාංකීය ධනපති පාලනය තීරණාත්මක මංසන්ධියකට ළඟාවී ඇති බවය. මෙම අර්බුදය විසඳගැනීම සඳහා වීදිබැස සිටින ජනතාව තවත් පියවර කීපයක් ඉදිරියට ගමන් කළ යුතුව තිබේ. මෙම ජන අරගලය හුදු විරෝධතා ව්‍යාපාරයක සිට ලංකාව මුහුනදෙන සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදයට විසඳුම් ලබාදීමේ තත්වයක් කරා වර්ධනය විම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයක් අපේක්ෂා කරන බලවේගවල ප්‍රමුඛ කාර්ය විය යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර නව ව්‍යවස්ථාවක් ගොඩනැගීම සඳහා වහාම කටයුතු කිරීමය. ගෝඨාභය ජනාධිපතිධුරයේ තබාගනිමින් රනිල් වික්‍රමසිංහ අගමැති කරන අන්තර්වාර ආණ්ඩවක් ගොඩනැගීම යන්න වීදිබැස සිටින ජනතාව නොමග යැවිම සඳහා බටහිර අධිරාජ්‍යවාදීන් සමග ධනපති පංතියේ විවිධ කල්ලි හා කණ්ඩායම් විසින් ගෙන එනු ලබන මර උගුලකි. අන්තර්වාර ආණ්ඩුවකින් රට මුහුණ දෙන අරුබුදයට කිසිදු විසඳුමක් ඉදිරිපත් කිරිමට අපොහොසත් වන බව නියතය. එබැවින් දූෂිත රාජපක්ෂ හොර නඩය බලයෙන් පහකර දමා මහ මැතිවරණයක් පැවැත්වීමට පියවර ගතයුත්තේ ගෝඨාභය ඉවත්කර බිහිකර ගන්නා නව ජනරජ ව්‍යවස්ථාවක් යටතේ විය යුතුය. එතැනින් ආරම්භ කෙරෙන ජනතා අරගලය සැබෑ ජයග්‍රහණයක් කරා ඉදිරියට වර්ධනය කර ගැනීම විප්ලවවාදීන්ගේ ඊළඟ කාර්යභාරය වනු ඇත. එය කම්කරුවන්ගේ හා ගොවින්ගේ නායකත්වයෙන් පිහිටුවනු ලබන සමාජවාදී ආණ්ඩුවක් බිහි කිරීම දක්වා ගමන් කිරිම අත්‍යවශ්‍ය වනු ඇත.

**තාරක**

# දරුවන් අතුරුදන් දෙමළ මවකගෙන් ගෝල්ෆේස් අරගලකරුවන්ට ආරාධනයක්



දශක ගණනාවක් පුරා කෙරෙන දෙමළ ජනයාගේ නිදහස් සටන ගැන අවබෝධ කරගෙන දකුණේ අරගලකරුවන් ඊට සහයෝගය ලබා දිය යුතු බවට උතුරේ අතුරුදන් කරන ලද්දවුන්ගේ මව්වරු ඉල්ලීමක් කර තිබේ.

''පහුගිය කාලේ දෙමළ ජනයා මර්දනය කළේ ඇයි කියලත්, ඇයි ඒගොල්ලෝ සටන් කළේ කියලත් දකුණේ අරගලකරුවන් කල්පනා කරන්න ඕනෑ. ඒ ගැන තේරුම් අරගෙන අපිට ස්වයං නිර්ණය අයිතිය ලබා දෙන්න ආණ්ඩුවට බලපෑම් කරන්න ඕනෑ,'' යැයි උතුරු නැගෙනහිර දී රජයේ හමුදා විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කළවුන්ගේ ඥාතීන්ගේ සංගමයේ ලේකම් ලීලාදේවි ආනන්දනඩරාජා ඉල්ලා සිටින්නීය.

යුද්ධයේ අවසානයෙන් 13 වසරක් ගතවීත් දෙමළ ජනතාවට යුක්තිය ඉටුවී නැති රටේ පවතින වාතාවරණය ගැන මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඇය පවසන්නේ කිනම් ධනපති ආණ්ඩුවක් බලයට පත් වුවද රටේ කිසිදු දෙයක් වෙනස් නොවන බවයි.

''උතුරට එක නීතියකුත්, දකුණට තවත් නීතියකුත් රටේ ක්‍රියාත්මක වෙන්නේ. මේක අපිට හොඳින්ම පෙන්නුම් කළේ ආනන්ද සුදාකරන් හා සුනිල් රත්නායක නිදහස් කිරීමෙන්.''

ඥානපාලන් රවිවීරන්, සෙල්ලමුත්තු දේවකුලසිංහම්, විල්වරාජා ප්‍රදීපන්, සින්නයියා විල්වරාජා, නඩේසු ජෙයචන්ද්‍රන්, කදීරන් ඥානචන්ද්‍රන්, ඥානචන්ද්‍රන් ශාන්තන් සහ පස් හැවිරිදි විල්වරාජා හමුදා පාලනය යටතේ පැවති යාපනයේ මිරුසුවිල් හිදී 2000 දෙසැම්බර් 19 දා හමුදා කණ්ඩායමක් විසින් දෙමළ සිවිල් වැසියන් අටදෙනෙකු අල්ලා දැස් බැඳ ඔවුන්ගේ උගුර කපා ම්ලේච්ඡ අන්දමින් ඝාතනයක් කර මළ සිරුරු මිරුසුවිල් හි වැසිකිළි වළක දමා තිබිණි.

හමුදා අත් අඩංගුවෙන් මිදී පලායාමට සමත්වූ එක් අයෙකුගේ ඇසින් දුටු සාක්ෂිය අනුව මෙම සිද්ධිය හෙළිදරව් කිරීමෙන් පසු හමුදා භටයන් 14 දෙනකු අත්අඩංගුවට ගත් අතර නීතිපති විසින් ඉන් 5 දෙනකුට අධිචෝදනා එල්ලකරනු ලැබූවද මරණීය දණ්ඩනය ලැබූ එකම හමුදා නිලධාරියා වුයේ ගජබා රෙජිමේන්තුවේ මාණ්ඩලික සැරයන් රත්නායක මුදියන්සේලාගේ සුනිල් රත්නායකයි.

ගජබා රෙජිමේන්තුවේ හමුදා නිලධාරියෙකුව සිටි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිධුරයට පත්වීමෙන් පසු මරණ දඬුවම් ලබා සිටි සුනිල් රත්නයකව ජනාධිපති සමාව යටතේ මුදා හැරිණි.

උතුරේ අරගලයට දායකත්වය ලබා දීම නිසා රජයේ හමුදා අත් අඩංගුවට පත්ව වසර ගණනවක් සිරගතව සිටින දේශපාලන සිරකරුවෙක් වූ ආනන්ද සුදාකරන් නිදහස් කළද තවමත් බන්ධනාගාරයෙන් මුදා හැර නොමැත.

දශක ගණනාවක් පුරා උතුරේ ජනයා පීඩාවට පත් කරමින් සිටින ආර්ථික අර්බුදය දැන් දකුණේ ජනයාට අත් විඳීමට සිදුවීමත් සමග ඒ ගැන අවබෝධයක් ඔවුන්ට ලැබෙනු ඇති බව අතුරුදහන් කළවුන්ගේ ඥාතීන්ගේ සංගමයේ ලේකම්වරිය පෙන්වා දෙන්නීය.

''උතුරු නැගෙනහිර දෙමළ අම්මාවරුන්ගේ නැතිවුණු දරුවෝ හොයා ගන්න ගෝඨාභය හා මහින්ද රාජපක්ෂට විරුද්ධව සටන් කරන දකුණේ අරගලකරුවන් උදව් කරන්න ඕනෑ. අපේ දරුවෝ ගැන යුක්තිය ඉටු කරගන්න තමයි අපි සටන් කරන්නේ කියලා දකුණේ ජනයා අවබෝධ කර ගන්න ඕනෑ.''

දස දහස් සංඛ්‍යාත දෙමළ ජනකායක් මරා දමන ලද හෝ අතුරුදහන් කරන ලද උතුරු නැගෙනහිර ජනතාව මුල්ලිවයික්කාල් අනුස්මරණයට සූදානම් වෙමින් සිටී.

## හුදෙකලා නොවූ නිම්නය

ශ්‍රීනාත් පෙරේරා

# ණය ගෙවන්න බෑ ගෙවන්නෙ නෑ

ආණ්ඩුවෙ අලුත් මුදල් ඇමතිවරයයි නව මහ බැංකු අධිපතිවරයයි වොෂින්ටන් ගිහිල්ල අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙ නිලධාරීන් එක්ක සාකච්ඡා කරල ඇවිල්ල ඉන්නෙ. ඇමතිවරයා කියන හැටියට මූල්‍ය අරමුදලෙන් ඇමරිකානු ඩොලර් බිලියන 2ක් විතර ලැබෙන්න නියමිතයි. ඒත් ඒ සඳහා මාස හයක විතර කාලයක් ගතවෙනවා. ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙනුත් විශේෂ අවස්ථාවල යම් යම් ආධාර ලැබෙනවා හදිසි මානුෂීය අවශ්‍යතා සපයාගැනීමට. හැබැයි මූල්‍ය අරමුදලෙ මුදල් ලැබෙන්නේ ලංකාවෙ රජය තම ණය තිරසරතාව debt sustainability සලසාගැනීම සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්ති අනුවයි.

මහ බැංකුවේ නව අධිපතිවරයා පත්කළ වහාම කරපු දෙයක් තමයි ලංකාවෙ ආණ්ඩුවට තවදුරටත් විදේශ ණය ගෙවීමට හැකියාවක් නැති බව ප්‍රකාශ කිරීම ඔහු නොකියා



කිව්වෙ මේ රට බංකොලොත් කියල. බංකොලොත් රටකට ණය ගෙවන්න හැකියාවක් නැහැ වගේම කිසි කෙනෙක් කිසි රටක් ණයක් දෙන්නෙත් නැහැ. ණය ගෙවන්න බැහැ කිව්වෙ මේ වෙලාවෙ තියෙන තත්වය අනුව. මේ වෙලාවෙ ආණ්ඩුව අතේ තියෙන මුළු විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 50ක් විතර සුළු ගණනක් බවයි අලි සබ්‍රි ඇමතිවරයා කිව්වෙ. ඒ ඩොලර් ප්‍රමාණයෙන් ණය ගෙවන්න හිතන්නවත් බැහැ. මේ අනුව ණය ගෙවීමට කල් ගැනීමකුයි ආණ්ඩුව කරන්නෙ. ඒ නිසා තමයි ණය දීම සහ ණය ගෙවීම කියන පදවලට අමතරව ණය ප්‍රතිව්‍යුහගත කිරීම කියන පදයකුත් ශබ්ද කෝෂයට එක්වෙලා තියෙන්නෙ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම අනුව කෙරෙන්නෙ ණය ගන්නා අවස්ථාවේදී එකඟ වූ ආකාරයට නැතුව ඊට පසු කාලයකදී ණය ගෙවීමට ක්‍රියා කිරීමයි. ඒ ගෙවන්නෙ කවදද කොයි ආකාරයටද, කොයිතරම් කාලයකින් ආදී කාරණා සම්බන්ධයෙන් ණය දුන්න රටත් සමග එකඟත්වයකට එන්න ඕන. ඒ අනුව ඇතැම් විට ණය පොලී තව වැඩි වෙන්න පුළුවන්.

ගෙවන්න බෑ ගෙවන්නෙ නෑ කියන මේ තේමා පාඨය මේ ආණ්ඩුවෙ ඊනියා ණය ප්‍රතිව්‍යුහගතකරණය හා සම්බන්ධ එකක් නෙවෙයි. ඉතාලියේ විසූ විශ්ව කීර්තිධර ලේඛකයකු වූ දාරියෝ ෆෝ නාට්‍යයක් ලිව්ව Canzt pay Wonzt pay කියල. ඊට පස්සෙ මේ පාඨය නාට්‍ය රාමුවෙන් බැහැරට ගිහිල්ල පවතින ධනේශ්වර සංස්ථාපිතයට එරෙහිව සටන් කරන රැඩිකල් බලවේගවල තේමා පාඨයක් බවට පත්වුනා. පාලකයන් විසින් අසාධාරණ ලෙස බදු පැනවූ අවස්ථාවලදී එම බදුවලට එරෙහිව සටන් කරන වෘත්තීය සමිති සහ වාමාංශික පක්ෂ තමන්ගේ තේමා පාඨය ලෙස යොදාගන්නෙත් මේ පාඨය තමයි.

බොහෝ අය ණය ගෙවීමේ ප්‍රශ්ණය ගැන නිහඬ පිළිවෙතක් අනුගමනය කරන පරිසරය තුළ අපි එක්සත් සමාජවාදී පක්ෂය හැටියට මේ රටේ විදේශ ණය සම්බන්ධයෙනුත් ගෙවන්න බෑ ගෙවන්නෙ නෑ කියන ප්‍රතිපත්තිය අනුගමනය කරන්න කියලයි කියන්නෙ. අන්තර්ජාතික මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන්, චීනයෙන්, ඉන්දියාවෙන්, ඇමරිකාවෙන්, ජපානයෙන් ආදී වශයෙන් ලබාගෙන ඇති ණය ගෙවන්නෙ නැහැ කියල ප්‍රකාශ කරන්නය කියලයි අපි මේ රටේ පාලකයන්ට කියන්නෙ. ඒ හැර ඊනියා ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් මේ රටට ගැලවීමක් නැහැ. හෙට නෙවෙයි නම් අනිද්දට මේ ණය ගෙවන්න ඕන.

ඒත් එතනදිත් ප්‍රශ්නයක් මතුවෙනව. අපේ රට මත අපේ ඔළුගෙඩි මත ගොඩගසා ඇති ණය කන්ද මේ පාලකයන් විසින්ම ලබාගත් ණයයි. ණය ලබාගත්තේ මහින්දද, රනිල්ද, ගෝඨාභයද කියන එක මෙතනදි අදාළ නැහැ. ධනපති පාලකයන් විසින් කිසිදු මහජන අනුමැතියකින් තොරව ඔවුන්ගේ ඕනෑඑපාකම් අනුව ලබාගත් ණය තමයි මේ ගොඩගැහිල තියෙන්නෙ. මෙහෙම ණය ලබාගන්නය කියල පොදු ජනතාව කිසි දවසක මේ පාලකයන්ට කියල නැහැ. ඒ වගේම මේ විදියට ණය ලබාගන්නව කියල කිසිදු අවස්ථාවක මේ පාලකයො ජනතාවට කියලත් නැහැ. ඒත් ඔවුන් ණය අරගත්තෙ රටේ සහ ජනතාවගේ නාමයෙන්. ඒ නිසා මේ ණය ගෙවන්න අපි බැඳිල ඉන්නව. හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ, නෙළුම් කුළුණ සූරියවැව ක්‍රීඩාගාරය වගේ පොදු ජනයාට කිසිදු පලක් සිදුවී නැති ව්‍යාපෘතිවලට රාජපක්ෂ පාලනය මිලියන ගණන් චීනයෙන් ණය ගත්තෙ අපට සුරංගනා ලෝක පෙන්නල. අද ඒව සුදු අලි විදියට අපේ ජාතික දේහය ගිල දමනව. මේ දක්වා තඹ සතේක ප්‍රයෝජනයක් නැති නෙළුම් කුළුණ වගේ ව්‍යාපෘතියක් වෙනුවෙන් මේ රටේ ජනයා වසරකට රුපියල් මිලියන 560/- ක පොලියක් ගෙවනව. මුළු දකුණු සහ අග්නිදිග ආසියාවේම උසම කුළුණ කියල මහින්ද රාජපක්ෂගේ පම්පෝරිය වෙනුවෙන් හදපු මේ කුළුණ දැන් ඇත්තටම මේ රටේ ජනතාවගෙ ඔළුව උඩට කඩාවැටිල ඉවරයි.

මේ විදියට කිසිදු හොයාබැලීමකින් තොරව පාලකයන්ගෙ ප්‍රතිරූප නංවන්න කියපු කරපු දේ නිසා තමයි මේ රටේ ණයබර ජනතාවට දරාගන්න බැරි තරමට උග්‍රවෙලා තියෙන්නෙ. ඒත් පාලකයො ණය ගන්නෙ රටේ ජනතාවගේ නාමයෙන් මිසක් උන්ගෙ නමින් නෙවෙයි. ඒ නිසා උන් මේ කිසිදු ණයක් ගෙවන්න බැඳෙන්නෙ නැහැ. ඒත් අපේ නමින් ණය අරගෙන තියෙන නිසා මේ ණය ගෙවන්න රටේ ජනතාව හැටියට අපි බැඳිල ඉන්නව. හරියටම කිව්වොත් අපව බන්දවල තියෙනව. ලයිට් නැතුව, ගෑස් නැතුව, තෙල් නැතුව දුක් විඳින ජනතාවට සිදුවෙලා තියෙනවා මේ ධනපති නායකයන්ගෙ පව්වලට කරගහන්නත්.

ඒ නිසා පොදු ජනයා හැටියට අප හඬගා කියන්න ඕන ලෝකෙටම ඇහෙන්න මේ ණය කන්ද අපට ගෙවන්න බැහැ ඒ නිසා අපි ගෙවන්නෙ නැහැ කියල. හැබැයි එහෙම කිව්වම ඉන්දියාවෙ මෝදි හරි චීනයෙ ෂී ජින් පිං හරි පිලිගනියිද ආකමක් නෑ කියල. උන් අවි අමෝරාගෙන එයි අපට විරුද්ධව අපේ ණය ගෙවපන් කියල. එහෙම නැත්නම් රටින් කෑල්ලක් ඉල්ලයි. ඉතින් අපට පුලුවන්ද ණය නොගෙව ඉන්න.

කම්කරු පන්තිය මත පදනම් වී බලයට එන විප්ලවකාරී ආණ්ඩුවක් නම් තම වැඩපිළිවෙළක ප්‍රධානතම අංගයක් හැටියට කියන්නෙ ධනපති පාලකයන් විසින් මේ රටේ ජනයා උකසට තබා අරගෙන ඇති මේ මහා ණය තොගය ගෙවන්න අපට බෑ ඒ නිසාම අප ගෙවන්නෙ නෑ කියල. විප්ලවකාරී ආණ්ඩුවක් කියල ණය දුන් ආයතන හෝ ආණ්ඩු ණය ගෙවන ලෙස ඉල්ලීම අතඅරින්නෙ නෑ. අතඅරින්නෙ නෑ විතරක් නෙවෙයි ණය නොගෙව හිටියොත් අපේ බොටුව මුලින්ම මිරිකනව. මොකද අපි වගේ පුංචි රටකට අධිරාජ්‍යවාදී ආයතන හෝ රටවල් එක්ක හැප්පෙන්න බෑ මොනම විදියකින්වත්. උන් අපට විරුද්ධව යුද්ධ කරන්න එන එකක් නැහැ. ඒත් ආර්ථික වශයෙන් අපේ රටේ බොටුව මිරිකන්න උන්ට ඒ හැටි අමාරු නැහැ. ලංකාවට දෙන තෙල් ටික නැවැත්තුව ගමන්ම අපේ රටේ බෙල්ල හිරවෙනව තමයි.

මුලින් සඳහන් කළ විදියට මේ විදෙස් ණය කන්දරාව නොගෙව ඉන්න පුළුවන් වෙන්නෙ කම්කරු පන්තිය මත පදනම් වූ වමේ විප්ලවකාරී ආණ්ඩුවකට විතරයි. වමේ විප්ලවකාරී ආණ්ඩුවක් නම් අනිවාර්යයෙන්ම එය ජාත්‍යන්තරවාදී දැක්මක් සහිත එකක්. ලංකාව තුළ බිහිවන එවන් ආණ්ඩුවක් ලෝක කම්කරු පන්ති ව්‍යාපාරය සමග විප්ලවකාරී ලෝක දැක්මක් සමග බද්ධ වී වැඩකරනු ඇති. ඉන්දීය අර්ධ මහාද්වීපය තුළ කම්කරු පන්ති ව්‍යාපාරය සමග එක්වී වැඩකිරීම මෙහිදී විශේෂයෙන්ම වැදගත් වෙනව. ප්‍රතිගාමී ධනේශ්වර බලවේගවලින් එල්ල වන දැඩි පීඩනයට සහ ග්‍රහණයට මුහුණ දෙන්න පුළුවන් වෙන්නෙ එසේ ලෝක කම්කරු පන්ති ව්‍යාපාරය සමග බද්ධ වී වැඩකළොත් විතරයි.

ලංකාවේ වමේ විප්ලවකාරී ආණ්ඩුවක් විසින් ණය ගෙවීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ඉන්දියාවෙ ධනපති ආණ්ඩුවේ ග්‍රහණයට අප අනිවාර්යයෙන්ම ලක්වෙනව. මෙහිදී ඉන්දියාවෙ ධනපති පාලකයන් ක්‍රියා කරනු ඇත්තෙ ලෝක ධනපති පන්තියේ නියෝජිතයා වශයෙන්. ඒ නිසා අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවලත් ඇමරිකාව ප්‍රමුඛ ධනපති රාජ්‍යවලත් පූර්ණ සහාය සහ අනුග්‍රහය ඉන්දීය ධනපති පන්තියට ලැබෙනවා. එයට මුහුණ දෙන්න පුළුවන් වෙන්නෙ අප ඉන්දියාවෙ කම්කරු පන්ති ව්‍යාපාරය සමග ඍජු ලෙස බද්ධ වූ වැඩපිළිවෙළක හිටියොත් විතරයි. මෙවන් අවස්ථාවක ඉන්දියාවෙ ධනපති ආණ්ඩුවක් විසින් මෙරටට එරෙහිව පනවනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් ව්‍යර්ථ කිරීමේ හැකියාව ඉන්දියාවෙ යෝධ කම්කරු පන්තියට තියෙනවා. වැඩවර්ජන සහ වෙනත් විරෝධතා ක්‍රියාමාර්ග ඔස්සේ මෙරටට එරෙහි ආක්‍රමණකාරී ක්‍රියා වැළැක්වීමට මෙන්ම ලංකාවෙ පීඩිත ජනයාට අත්‍යවශ්‍ය සැපයුම් ලබාදීමටත් ඉන්දියාව ඇතුළු මේ කලාපයේ සංවිධිත කම්කරු පන්ති ව්‍යාපාරයට තියෙනවා.

ලෝකයේ ධනවත් බලවත් රාජ්‍යයන්ට රටේ සම්පත් විකුණමින් ධනපති පාලකයන් විසින් උකස් කරඇති මේ රට මේ ණය උගුලෙන් බේරගන්න පුළුවන් වෙන්නෙ එවන් විප්ලවකාරී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් විතරයි. බැලූ බැල්මට අසීරු වැඩක් ලෙස පෙනුනත් මෙවන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමෙන් තොරව අපේ රටට ගැලවීමක් නැහැ. ජාත්‍යන්තරවාදී විප්ලවකාරී බලයක් ගොඩනැගීම මේ මොහොතේ අත්‍යවශ්‍ය කාරණයක් වී ඇත්තේ මේ නිසයි.

# ආගන්තුකයාගේ කොලම

# ගෝඨාගේ මධුර ජවනිකා..!

ලලිත් අබේසිංහ

ඉරිසියාකාර විරුද්ධවාදීන් පවසන්නේ උත්කර්ශවත්ව කරලියට ආ වැඩ කරන අපේ විරු ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව බකල ගසන්න පටන් ගෙන දැන් සෑහෙන කලක් බවය. වෙන අය වගේ නෙවෙයි මෙයා හොඳටම කරයි යන්න හැට නව ලක්ෂයේ ඒකායන විශ්වාසය විය. ජයග්‍රහණය සමග රටේ සියලු තාප්ප බැමි බෝක්කු නෙක වර්ණයෙන් වර්ණවත්ව ජාත්‍යානුරාගී චිත්‍රවලින් ඔප් නංවන්න මෙරට තරුණ පරපුර රොද බැඳ ගත්තේ එනිසාය. ව්‍යාපාරික ප්‍රජාවද තරුණයින්ගේ මෙම ඉමහත් සත්කාර්යයට දායක වන්න හෝ නම දාගන්න පේන්ට් ආදියද තම වියදමින් රැගෙන දීමට පසු බට නොවූයේ එනිසාය. සමහර පුද්ගලික රේඩියෝ ටීවී නාලිකා ප්‍රධානීහු තරගෙට මේවාට සහාය වූයේ එනිසාය. ඉන් නොනැවතුන තරුණ කැල පුරන් කුඹුරු අස්වද්දන්නද ඉදිරිපත් වූයේ එනිසාය.

එවන් අපේක්ෂා මල්පල ගන්වමින් මාගේ ෆොටෝ කිසිදු රාජ්‍ය ආයතනයක ප්‍රදර්ශනයන නොකළ යුතු බවට නියෝග කිරීම එතුමාගේ දුරදක්නා නුවනට කදිම ඉගියකි. මේ කාලය වන විට මෙම ෆොටෝ ජායාරූප බිත්තිවල එල්ලී තිබුනේ නම් ඒවාට වෙන සැන්ටැනසිය එතුමා ඒ දිනවලම වටහාගෙන තිබීම ඉතාම වර්ණනා කළයුතුය.

ටික කලකින්ම තුන්කල් බලන සැබෑ නායකයෙක් ලෙස මුලු රටම එකරැයකින් රසායනික පොහොරවලින් තොර කාබනික ආහාර නිෂ්පාදනය කරන ලෝකයේ ප්‍රථම රට බවට පත්කරන්නට එතුමා කටයුතු කළ අතර ඉරිසියාකාරයින් මඩ ගැහුවේ ආණ්ඩුව ගිලී තිබූ ආර්ථික හා ඩොලර් අර්බුදයෙන් ගොඩඒමේ උප්පරවැට්ටියක් ලෙස එය කල බවය. එයින් මහත්සේ දුක්වූ එතුමා ටික කලකට පසු ගැසට්ටුවක් ගසා ලෝක වාර්තා තැබූ එම උත්කර්ෂවත් තීන්දුව අකුලාගත්තේ ඉරිසියාකාර ජනමතයට කන්දෙමිනි.

උයාපිහා ගන්නවත් ගෑස් නැතැයි සමස්ථ රටවැසියා අදෝනා නගන විට මෙම ගෑස් සිලින්ඩරවලට පුරවන්නේ කෙසේදැයි සොයා බැලීමට කොම්පැණිවල නිරීක්ෂන චාරිකාවක් කලේ සැබෑ නායකයෙකු ලෙසය. ඉන්පසුව තිබුන ගෑස් ප්‍රමාණයත් නැතිවූ බව වෙනම කතාවකි. රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලිය බොහෝ අකටයුතුවලින් පිරුනු එකක් ලෙස හඳුනාගත් එතුමා අවුරුදු දෙකකට පමණ පෙර හොර රහසේම එම ආයතනය කඩාපැන්නේ හොරුටික අතටම අල්ලා ගැනීමේ චේතනාවෙනි. එම ආයතනයට ගොස් මසක් ඇතුලත වහාම වැඩපිළිවෙලක් ඉදිරිපත් කරන ලෙස ඔහුගේ විධායක බලතල භාවිත කොට නියෝග කලේය. එයට මේ වන විට වසර දෙකක් පමණ ගතවුවද තවම අර මාසය ගතවී නැත. රුපියල් 100ට පමණ හාල් කිලෝවක් නැග්ගවිට එතුමා මැනින් වෙළඳපොළ වගේ තැනකට ගොස් තොග මුදලාලිගේ පුටුවේ වාඩිවී හතර අතට කතාකොට හාල් කීයදැයි විමසා බැලීම ඇත්තටම ජනහිතකාමී නායකයෙකුගේ සැබෑ කාර්යයකි. එපමණක් නොව විශ්‍රාමලත් හමුද නිලධාරියෙකු අත්‍යවශ්‍ය කොමසාරිස් ලෙස පත්කොට වහාම හාල් මාෆියාව මැඩලන්නට ඩබ්ලි වටලන්න යැව්වේ ලොරිද සමගය. ඩබ්ලි එහිදිද කිව්වේ හාල් මිල තවත් නගින බවය. එයින් උරනවූ කොමසාරිස්තුමා හාල් පටවාගෙන කොළඹ පැමිනියේය. හාල්ම ලොරි 3කිග අද වන විට හාල් අහස උසට මිලනැග තිබීමද වෙනම කතාවකි. එතුමා තවම ගියේ නැත්තේ ඉස්කාගාර සංස්ථාවටයග එසේ යන්නට බැරිවී ඇත්තේ ශ්‍රී ලංකා බොන්නන්ගේ සංගමය ඥානක්කා මගින් එයට නොයන ලෙසට බන්ධනයක් ජපකර ඇති නිසා බවට ඉරිසියාකාරයෝ මඩක් ගසා ඇත.

කොහොම නමුත් මෙවන් ප්‍රගිතිශිලි නායකයන් රටවල් පාලන කරන විට එවන් අයගේ දූඩි තීරනවලින් අපහසුතාවන්ට පත්වන දූශිතයින්ල වංචනිකයින් හා ජාවාරම්කරුවන් බඩුමුට්ටු හංගා ජනතාව අපහසුතාවයට පත්කොට ආණ්ඩු පෙරලා දැමීමට කටයුතු කළ ආකාරයන් ලෝකයේ විවිධ රටවල අප අත්දැක ඇත. මෙහෙ වුනෙත් ඒකමය.

ගොවියෝල ධීවරයෝල ගෘහනියොල කම්කරුවො වැඩවරා අවිඅමෝරා ගෙන ආ නමුත් විවිධ වාම හා දක්ෂිනාංශික පක්ෂ මහා රැස්වීම්, පිකට් සංබේත වර්ජන, පෙළපාලි, හර්තාල් පැවැත්වූ නමුත් තමන්ගේ මිරිහාන ගේ වටකොට බස්ද ගිනිතැබූ නමුත් ඒවායෙන් නොසැලුනු ජනපති ප්‍රතිචාර දක්වූයේ තම කාර්යාලය ඉදිරියේ ගෝඨා ගෝ හෝම් ගමට පමණී. ඒ එය අහිංසා හා තරුණකැල නායකත්වය ගත් නිසාය. එයට කන්දෙමින් තමන් ගෝ හෝම් වෙන්න කලින් තම සොයුරා අගමැතිකමින් ඉවත් කලේ වෙනකවුරුත් එය නොකරාවියැයි යන හැගීමෙනි.

ජනපති කල්පනා කලේ ගෝඨා ගෝ හෝම් කියල කියන්නේ ඊට පෙර සිටි ආණ්ඩුව පරදවා තමන් බලයට ගෙනඒමට හැටනම ලක්ෂය එය අපරාදෙ කියා සිතන බවය. එතුමා තම ගැසට් රිවස් කර ගත්තාසේ තම පත්වීමද රිවස්කර ගන්න මුලික අඩිය තබා ඇත. ඒ තම කඳවුරේ ප්‍රධානතම සතුරා වූ අධිරාජ්‍ය ගැති දේශද්‍රෝහී මහ බැංකු හොරාකෑ රටවිකුණන රනිල් යළි අගමැති කිරීමෙනි. එවන් නිර්භිත විප්ලවවාදී තීරන ගන්නා නායකයෙකු ලෝක ඉතිහාසයේම නැත. මෙයින් සිදුවූ එකම අලකලන්චිය වීරවංශ උන්නැහේට බනින්වත් කවුරුත් ඉතිරිකරපු නැති එකය.

මෙවන් මධුර ජවනිකා නොනැවති එකක් පිටුපස තව එකක් ගෙන එන නායකයෙකු කවරදකවත් අපට ලැබී නැත. මෙතුමා අප රටේ පමණක් නොව ලෝකයේද ඉතිහාස ගතවන්නේ එවන් මධුරජවනිකා නිර්ලෝභිව තම ජනතාවට ලබාදුන් නායකයෙකු හැටියටය.



# දකුණට ඇති උතුරට නැති සැමරුම්

මැයි මාසය දකුණේ සිංහල බෞද්ධ ජනතාවට වැදගත් වගේම දෙමළ ජනතාවටත් වැදගත් මාසයක්. අපි කවුරුත් දන්නා පරිදි මීට වසර 13ට පෙර රාජපක්ෂ පාලනය යටතේ යුද්ධයේදී ඝාතනයට ලක්වූ දෙමළ වැසියන් සිහිකිරීම සෑම වසරකම මැයි මස 18 වන දින සිදුවිය. එවැනිම ඓතිහාසික සිදුවීමක් පසුගිය 8වනදා සිදුවිය. එනම් ලංකා ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ පරිදි ජන අරගලයකින් අගමැතිවරයෙක් ධූරයෙන් පහකිරීමට ලාංකේය අරගලකරුවන්ට හැකිවිමයි.

මැයි මස 12 යන දින සිට 18 දින දක්වා මුල්ලිවයික්කාල් හිදී ඝාතනයවූ දෙමළ වැසියන් සිහිකිරිමේ සතිය "ජන සංහාර" සතිය ලෙස ඔවුන් නම්කර ඇත. වසර 13ක් තිස්සේ උතුරේ ජනතාව සාමකාමී අරගලයක නිරත විය. ජාතිවාදී දේශපාලන නායකත්වයකින් හා දකුණේ ජනතාව එය දැක්කේ LTTEකාරයන් ආරක්ෂ කිරීම වෙනුවෙන් කරන අරගලයක් ලෙසිනි. තම ආදරණීයයන් මරා දැමීම වෙනුවෙන් තම ආදරණීයයන් අතුරුදන් කිරීම වෙනුවෙන් රාජපක්ෂලාට විරුද්ධව ඔවුන් එදා සිටම වව්නියාව මන්නාරම මුලතිව් හා යාපනය වැනි ප්‍රදේශවල නිහඬ විරෝධතාවක් ගෙනගියේය. අද දකුනේ ජනතාව රාජපක්ෂලාට විරුද්ධව අරගලයක් දියත් කර ඇත. දකුනේ ජනතාවට මේ ධනපති පාලකයන්ගේ ඇත්ත ස්වභාවය තේරුම් ගැනීමට දශක ගණනාවක් ගතවිය. නමුත් උතුරේ ජනතාව එදා සිටම තමන්ට ජීවත්වීමට නිදහස ඉල්ලා සටන් කළේය. එය කොතරම් සාධාරණ සටනක් දැයි දකුණේ ජනතාවට දැන්වත් තේරුම් යනවා ඇත. හැමදාම LTTE බිල්ලන් මවමින් ජනමනස විකෘති කරමින් ඔවුන් වැජඹෙන්නට උත්සාහ කළේය. අද වන විට ඒ සියල්ල විනාශවී හමාරය. දකුනේ ජනතාවට තිබෙන අරගලය කිරිමේ අයිතියවත් උතුරට නොමැති තත්වයක් තුළ ඔවුන් යුද්ධ අවසන්වී වසර ගණනාවක් ගියත් තවමත් තමන්ට සාධාරනය ඉල්ලා සටන් කරමින් සිටිති.

ඕනෑම ජන සමාජයක තම මියගිය ඥාතීන් සිහිකිරීම ඔවුන්ට ඇති අයිතියකි. නමුත් දෙමළ ජනයාට අද වන විට එම අයිතියවත් නැතිවී තිබේ. රට පාලනය කරන පාලකයන්ගේ අභිමතය පරිදි එය සැමරීමට සිදුවී තිබේ. ඒ අනුව ගෝඨාභය දෙමළ ජනයාට විරුද්ධ පාලකයෙක් බැවින් මුල්ලිවයික්කාල් සැමරුම තහනම් කර තිබේ. මිය ගිය ආදරණීයන් සැමරීමටත් ඉඩදීමට භය පාලකයන් අද වන විට නැවත වටයකින් LTTE ඉන්දීය බිල්ලන් පෙන්වීමට උත්සාහ කරමින් සිටී. තමන්ගේ අසමත්කම ඉදිරියේ ජාතිවාදය ඇවිස්සීම ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙන් ඉදිරියට ගෙන තිබේ. උතුරේ වුවත් දකුනේ වුවත් මියගියේ අපේ රටේ පුරවැසියන්ය. දකුණේ තරුණයන් ජීවත්වීමට රටක් ඉල්ලා අද පාරට බැස තිබේ. උතුරේ තරුණයන් එදා පාරට බැස්සේ දෙමළ ජනතාවට ජීවත්වීමට අයිතිය ඉල්ලමිනි. ඔවුන් වසර 30ක් අරගල කළේ ඒ වෙනුවෙනි. 2009 මැයි 18 අවසන් සටනේදී මියගිය හා අතුරුදන් වුවන් වෙනුවෙන් සෑම වසරකම සිහිකරන මුල්ලිවයික්කාල් සැරුම අද තහනම් වන්නේ රාජපක්ෂලාගේ ආරක්ෂකයා වන රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා යටතේය. සැමට සාධාරණය වෙනුවෙන් පෙනී සිටිනවා යැයි කියන පාලකයන් අද ක්‍රියාකරන්නේ තම පන්තිය රැකගැනීමට මිස ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමට නොවේ.

අද වන විට රට තුළ අරගලකාරී තත්වයක් නිර්මාණය වී තිබේ. මෙම අරගලය උතුර දකුන ඒකාබද්ධවූ අරගලයක් බවට පත් වන්නේ නම් මීටත් වඩා සාර්ථකවේ. දකුණේ තරුණයන්ට උතුරේ ජනතාවගේ ඉල්ලීම් දෙස සාධාරණ මනසකින් බැලිය හැකි නම් ලාංකේය ජනතාවගේ අරගලයක් බවට මෙය පත්කිරීමට තිබෙන හොඳම අවස්ථාව මෙය වේ. මෙවැනි තත්වයක් ඉදිරියේදී නිර්මාණය නොවනු ඇත. හැමදාම උතුරේ ජනතාව මෙන්ම දකුණේ ජනතාවද තම තමන්ගේ ඉල්ලිම් වෙනුවෙන් පමණක් පෙනී සිටින්නේ නම් අපට කවදාවත් ලාංකේය ජාතියක් නිර්මාණය කළ නොහැකිවේ. ගෝල්ෆේස් අරගල බිමේ සියලු ක්‍රියාකාරකම් සිදුවුනා මෙන් ම මුල්ලිවයික්කාල් සැමරුමක් කළ හැකි නම් එම අරගලය කොතරම් ජාතික අරගලයක් වනු ඇත්ද? දකුණේ සිංහල ජනතාව හා උතුරේ ජනතාව ඒකාබද්ධවූ අරගලක් අද දවසේ කළ හැකි නම් එය ලංකා ඉතිහාසය රන්අකුරින් ලියන අරගලයක් වනු ඇත.

**ධම්මිකා ද සිල්වා**

# මන්ත්‍රී වැටුප් වරප්‍රසාද වහාම අහෝසි කරනු

ගෝඨාභයට ගෙදර යන්න කියන ජන අරගලයේ එක ප්‍රධාන තේමාවක් වනුයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු දේශපාලකයන් භුක්ති විඳින අධික වරප්‍රසාද අහෝසි කළයුතු බවයි. දැනට පාර්ලිමේන්තු මැති ඇමතිවරු මහජන මුදලින් වරප්‍රසාද රැසක් භුක්ති විඳිති.

ඔවුන්ට ගෙවනු ලබන වැටුපට අමතරව දුරකථන, සංග්‍රහ, ඉන්ධන, කාර්‍යාල ආදී වශයෙන් තවත් දීමනා රැසක් ගෙවනු ලැබේ. එමෙන්ම පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම් ආදී වශයෙන් කාර්‍ය මණ්ඩලයක් ද ලබාදී තිබේ. මේ දීමනා සියල්ලේම එකතුව මසකට රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩි වේ. වසර පහක් මන්ත්‍රී ධූරය දැරූ අයකුට පසුව විශ්‍රාම වැටුපකටද හිමිකම් ලැබේ.

රටේ ආර්ථික අර්බුදය උග්‍ර වී ජනයා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමටවත් නොහැකිව පෝලිම්වල පීඩා විඳිද්දී මේ වරප්‍රසාද අහෝසි කළයුතු බවට විටින් විට අදහස් පළවුවද මාස තුනක කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට ආණ්ඩුව හෝ පාර්ලිමේන්තුව නියෝජනය කරන කිසිදු පක්ෂයක් ඉදිරිපත් නොවීම පුදුම සහගතය. විශේෂයෙන්ම මෙවැනි කාරණා ගැන වෙන අවස්ථාවලදී මොරදෙන ජවිපෙ මේ කාරණය ගැන නිහඬ පිලිවෙතක් අනුගමනය කිරීම ඔවුන්ගේ වංචනික දේශපාලන පිළිවෙත පිළිබිඹු කරයි.

ගරු සේවයක් යයි කියන දේශපාලනය සහ මන්ත්‍රී පදවි දරන්නන්ට කරන නිශ්චිත කාර්‍යයක් සඳහා ගෙවීමක් කරනු මිස මාසිකව වැටුප් සහ දීමනා ලබාදීම වහා නැවැත්විය යුතුයයි නිදහස් වෘත්තීය සමිති මධ්‍යස්ථානය පෙන්වාදෙයි.

# අභියෝග ජයගත් සමාජවාදී මැයි දිනය
















# අපේ ආචාරය

## ලීනස් ජයතිලක
(1942 - 2022)



එක්සත් කම්කරු සම්මේලනයේ සහ වාණිජ හා කාර්මික සේවක සංගමයේ සභාපතිවූ ලීනස් ජයතිලක සහෝදරයා මැයි මස 11 වෙනි දින අභාවප්‍රාප්ත විය. තරුණ කතෝලික පූජකයෙකු ලෙස මිගමුවේ ප්‍රධාන පල්ලියේ කටයුතු කරමින් 1973 දී අපට මුණගැසුණු ලීනස් ඉන් පසුව නව සමසමාජ පක්ෂයට බැඳී එහි ප්‍රධාන පෙළේ ක්‍රියාකාරී නායකයකු බවට පත්විය. එදා සිට ඔහු මිය යන තුරුම වෘත්තිය සමිති ව්‍යාපාරයේ නායකයකු ලෙස බාටා, ලිවර්බ්‍රදර්ස් වැනි ප්‍රධාන ආයතන ඇතුළු පුද්ගලික අංශයේ පැක්ටරි ගණනාවක කම්කරු පංතියේ උන්නතිය වෙනුවෙන් ජීවිත කාලයම කැප කළේය.

එපමණක් නොව කම්කරු නායකයෙකු ලෙස කටයුතු කරන අතරතුර ගොවි ජනතාවගේ අයිතීන් වෙනුවෙන් මීට වසර කීපයකට පෙර මිය ගිය සරත් ප්‍රනාන්දු සහෝදරයා සමග ඉඩම් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සමඟ ඉතා සමීපව කටයුතු කරන ලදී. කම්කරුවන් හා ගොවි ජනතාවගේ යන දෙකොට්ඨාශයේම නායකයකු ලෙස එකවර කටයුතු කිරිම ලීනස් තුළ පැවැති විශේෂිත ලක්ෂණයකි. ලිනස් ජයතිලක වැනි ආදර්ශමත් හා පරිත්‍යාගශීලී නායකයින්ගෙන් මෙරට කම්කරු පංති ව්‍යාපාරය ලබාගත් ජයග්‍රහණයන් ආරක්ෂා කර ගනිමින් පන්ති අරගලය ඉදිරියට ගෙනයෑම ඔහුට දැක්විය හැකි ඉහළම ආචාරය වන්නේය.



එම් කේ පියරත්න වන මා විසින් 53/6 ඊ ඩී දාබරේ මාවත නාරාහේන්පිට පිහිටි සමාජ පොත් පියස මුද්‍රණාලයෙහිදී මුද්‍රණය කරන ලදී